# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report 2010

LANKA SATHOSA

GRACEFULLY FORWARD

**සීමාසහිත ලංකා සතොස**
සාධාරණ වෙළඳාමේ පෙර ගමන්කරු

**லங்கா சதொச லிமிடட்**
நவீன வர்த்தகத்தின் தனிச் சிறப்பு

**Lanka Sathosa Limited**
A unique take on modern trade

# පටුන

| | |
|---|---|
| සංස්ථාපිත තොරතුරු | 1 |
| දැක්ම, මෙහෙවර හා අභිමතාර්ථ | 2 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 3 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 4 |
| සංස්ථාපිත පාලනය | 5 |
| මූල්‍ය සහ මෙහෙයුම් විශේෂ අවස්ථා | 6 - 7 |
| අගය එකතු කළ ප්‍රකාශනය | 8 |
| විගණන වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන | 9 - 25 |

# සංස්ථාපිත තොරතුරු

| | |
|---|---|
| ආයතනය | - සීමාසහිත ලංකා සතොස |
| ලියාපදිංචි ලිපිනය | - අංක. 108, නිග්‍රිස් ගොඩනැගිල්ල, යෝක් වීදිය, කොළඹ 01. |
| නෛතික තත්ත්වය | - 2007 අංක 07 දරන සමාගම් ආඥාපනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත පූර්ණ රාජ්‍ය සමාගමකි. |
| සමාගමේ ලියාපදිංචි අංකය | - පී බී 1326 |
| ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය | - අංක 108, නිග්‍රිස් ගොඩනැගිල්ල, යෝක් වීදිය, කොළඹ 01.<br>දුරකථන - 94-11-2436301-2<br>ෆැක්ස් - 94-11-2437583 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | - සභාපති / අධ්‍යක්ෂ - කේ. නලින් ආර් ප්‍රනාන්දු මහතා<br>- අතිරේක ලේකම් සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය - ඩී. ජීවානාදන් මහතා<br>- අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය ගිණුම් මහා භාණ්ඩාගාරය - ඩී. විදානගමාච්චි මහතා<br>- අධ්‍යක්ෂ ජනරාල් විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය කේ.එම්. ජයතිලක මහතා<br>- අධ්‍යක්ෂ මහජන මූල්‍ය දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය එන්. එම්. ඩී. නවරත්න මහතා<br>- සමුපකාර සංවර්ධන කොමසාරිස් ඒ. පී. ජී. කිත්සිරි මහතා<br>- ආහාර කොමසාරිස් ආහාර දෙපාර්තමේන්තුව නිමල්කා ඩයස් මිය<br>- කළමනාකාර අධ්‍යක්ෂ ඔරික්ස් බෙනෝඩාර් සමාගම එරල් වීරසිංහ මහතා<br>- සමාගමේ අධ්‍යක්ෂ ක්‍රිශාන්ත කපුවත්ත මහතා<br>- ගරු ඇමතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම් චමිල ජයාන් මුණසිංහ මහතා |
| අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | - සීමාසහිත එම්/එස් කෝපරේට් එෆෙයාර්ස් පුද්ගලික සමාගම,<br>68/1 ඩෝසන් වීදිය, කොළඹ 02. |
| විගණක සමාගම | - එම්/එස් එච්. එල්. බී. එදිරිසිංහ සහ සමාගම, වරලත් ගණකාධිකාරීවරු,<br>45, බේබෲක් පෙදෙස, කොළඹ 02. |
| සමාගමේ බැංකුකරුවෝ | - මහජන බැංකුව සංස්ථාපිත ශාඛාව, ලේක් හවුස් ගොඩනැගිල්ල,<br>ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10. |
| කොටස්කරුවෝ | - මහා භාණ්ඩාගාරය - කොටස් සියයට 45 යි.<br>සමුපකාර තොග වෙළඳ සංස්ථාව සියයට 55 යි. |



# දැක්ම

පුළුල් ලෙස පැතිර ගිය සිල්ලර වෙළඳ ජාලයක් බවට පත්වීම හා පාරිභෝගිකයන් වෙනුවෙන් කැප වූ, අගයෙන් අනූන විශිෂ්ට සේවා සපයන්නෙකු බවට පත්වීම අපේ දැක්මයි.



# මෙහෙවර

දේශීය හා ජාත්‍යන්තර වශයෙන් භාණ්ඩ මිලදී ගනිමින් රටපුරා ඇති අපගේ අලෙවිසැල් ජාලය මගින් සාධාරණ මිලට පාරිභෝගික භාණ්ඩ ලබාදෙමින්, කාර්යක්‍ෂම හා උසස් තත්ත්වයෙන් පාරිභෝගික සේවාවක් සැලසීම අපේ මෙහෙවරයි.

# අපේ අභිමතාර්ථ

තත්වයෙන් උසස් භාණ්ඩ සාධාරණ මිලකට ලබාදීම.
ලංකා සතොස සන්නාම ප්‍රතිරූපය නංවාලීම.
ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශවල තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ඇතිකිරීම.
දේශීය ගොවියන්ගේ හා කුඩා පරිමාණ නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම තුළින් ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීම.
රටේ මිල මට්ටම් ස්ථාවරව පවත්වාගෙන යාම.

# සභාපතිතුමාගේ පණිවුඩය



සීමාසහිත ලංකා සතොස 2010 දෙසැම්බර් 31 න් අවසන් වන වසරේ වාර්ෂික වාර්තාව හා විගණන මූල්‍ය ප්‍රකාශන එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම සතුටින් ඉදිරිපත් කරමි.

**කාර්ය සාධන සංක්ෂිප්ත වාර්තාව**

2010 දෙසැම්බර් 31 න් අවසන් වන වසරේ සමාගමේ ආදායම සියයට 124.4 ක වර්ධනයක් සහිතව රුපියල් බිලියන 13 ක් වාර්තා කළේය. 2010 වසරේ දළ ලාභය රුපියල් මිලියන 1,135.3 කි. එය 2009 වසරේ ලාභය වූ රුපියල් මිලියන 500.3 ට සාපේක්ෂව සියයට 127 ක වර්ධනයකි. එම කාලය තුළ මෙහෙයුම් ලාභය ඉකුත් වසරට සාපේක්ෂව 4 ගුණයකින් වැඩිවී රුපියල් මිලියන 98.6 දක්වා ළඟා විය. බදු ගෙවීමෙන් පසු ලාභය රුපියල් මිලියන 37.8 ක් වූ අතර එය සියයට 77.4 ක වර්ධනයකි.

මෙම වසරේදී ලංකා සතොස සිය අලෙවිසැල් ජාලය සැලකිය යුතු ලෙස ශාඛා 78 කින් වැඩිකරගෙන ඇති අතර සමාගමේ ආරම්භයේ සිට එක් වසරක් තුළ සිදුවූ විශාලතම වැඩිවීම වාර්තා කර තිබේ. වසර අවසානයේදී එම සංඛ්‍යාව 219 ක් විය. එමෙන්ම මෙම වසරේදී රටේ තරුණ තරුණියන් උදෙසා රැකියා අවස්ථා විශාල සංඛ්‍යාවක් උත්පාදනය කිරීමටද සතොසට හැකියාව ලැබුණි. රාජ්‍ය අංශයේ නැගී එන සිල්ලර වෙළඳ ජාලයක් ලෙස ලංකා සතොසට රටේ අඩු ආදායම් සහ මධ්‍යම ආදායම් සහිත කණ්ඩායම්වලට අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සාධාරණ මිලට අලෙවිකරමින් විශාල සේවාවක් සැලසීමට හැකි වී තිබේ.

**ස්තුතිය**

අවසන් වශයෙන් අභියෝගාත්මක වසරක සතොස කාර්යමණ්ඩලය දැක්වූ අධිෂ්ඨානය හා ඉටුකළ සේවාව පිළිබඳව ඔවුන්ට කෘතඥතාවය දැක්වීමටද මම මෙය අවස්ථාව කරගනිමි. ආයතනය ඉහළ තලයකට නංවාලීමට සිය ඉදිරිය දැකීමේ හැකියාව හා නායකත්වය මෙහෙය වූ අධ්‍යක්ෂ මණ්ඩලයට මගේ හද පත්ලෙන් නැගෙන ස්තුතිය පුදකරමි. එමෙන්ම ආයතනයේ උන්නතිය වෙනුවෙන් දිගටම සහාය දක්වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ක්ෂේත්‍රයේ සැපයුම්කරුවන්ට හා මූල්‍ය ආයතනවලටද මගේ ස්තුතිය හිමි වේ. එසේම අපේ කළමනාකරණ කණ්ඩායම්, සියලු මට්ටමේ කාර්ය මණ්ඩලය හා අප ගැන විශ්වාසය තබා කටයුතු කරන පාරිභෝගික ප්‍රජාවටද මගේ කෘතඥතාව මෙයින් පුදකරමි.

නලින් ප්‍රනාන්දු
සභාපති

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

අධ්‍යක්ෂවරු 2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන සමඟ ඔවුන්ගේ වාර්තාව මෙයින් ඉදිරිපත් කෙරේ.

**තැන්පතු**
සමාගමේ මුළු තැන්පතු වටිනාකම රුපියල් මිලියන 23.9 කි (2009 රු මිලියන 13.9)

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**
2010 දෙසැම්බර් 31 වනවිට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් 70 කි.

**රජයේ අරමුදල**
සමාගමේ රජයේ අරමුදල රුපියල් මිලියන 699.4 කි. (2009 රු. මිලියන 478.6)

**ප්‍රාග්ධන වියදම**
සමාගමේ දේපළ, පිරියත සහ උපකරණ සඳහා වන ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 183.9 ක් වේ. (2009 රු. මිලියන 78.9) වැඩි විස්තර මූල්‍ය ප්‍රකාශනවල අංක 10 සටහනේ සඳහන් වේ.

**අධ්‍යක්ෂ මණ්ඩලය**
සංස්ථාපිත තොරතුරු පිටුවේ දක්වා ඇති අධ්‍යක්ෂවරු විමර්ශනයට ලක්වූ වසර පුරාම සමාගමේ අධ්‍යක්ෂවරු වෙති.

**කොන්ත්‍රාත් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ අයිතිවාසිකම්**
මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 21 හි සඳහන් පරිදි සමාගමේ වත්මන් ව්‍යාපාර සම්බන්ධයෙන් එහි අධ්‍යක්ෂවරුන්ට කිසිදු ඍජු හෝ වක්‍ර අයිතිවාසිකමක් නැත.

**විගණන සමාගම**
එච්.එල්.බී. එදිරිසිංහ සහ සමාගමේ වරලත් ගණකාධිකාරීවරු එක දිගට වසර පහක් තිස්සේ සමාගමේ විගණනකවරුන් ලෙස ක්‍රියාකොට ඇත. ඉදිරියේදී වෙනත් විගණකවරයෙකු පත්කිරීමට හා ඔවුන්ගේ වැටුප් පිළිබඳව තීරණය කිරීමේ බලය අධ්‍යක්ෂවරුන් වෙත පවරා ඇත.

**වාර්තාකරණ කාලසීමාවට පසුව ඇතිවූ සිදුවීම්**
සමාගමේ වාර්තාකරණ කාලසීමාවට පසුව ඇතිවූ සිදුවීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 20 හි සඳහන් කොට ඇත.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**
වාර්තාකරණ කාලසීමාව සඳහා ශ්‍රී ලංකා රජය වෙත සහ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා හෝ ලබා දී ඇත.

**අඛණ්ඩ පැවැත්ම**
මෙම මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය අඛණ්ඩ පැවැත්ම යන පදනම භාවිත කළේය. කළමනාකාරීත්වයෙන් විමසීම් කරන ලදුව එම කණ්ඩායම සතු වූ දුරදක්නා අනාගතයක් උදෙසා සිය මෙහෙයුම් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඔවුන් සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්ව සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

අත්සන් කළේ

සීමාසහිත එම්. එස්. කෝපරේටිව් එෆයාර්ස් (පුද්) සමාගම
සමාගම් ලේකම්
2014 ජනවාරි 31



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

## සංස්ථාපිත පාලනය


සමාගම තුළ සංස්ථාපිත පාලන කටයුතු විනිවිද භාවයෙන් හා කාර්යක්‍ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා සමාගම් අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයන්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හා කාර්ය මණ්ඩලය කැපවී සිටින බැවින් සමාගම ස්ථාවරව පවතී. උසස් ප්‍රමිතියේ සංස්ථාපිත පාලනයක් පවත්වාගෙන යාමට හැකි විශ්වසනීයත්වයක් සමාගම සතුව තිබේ. ඒකාබද්ධ පාලනයක් රඳා පවතින්නේ තිරසාර අගයන් නිර්මාපිත හැකියාව ඇති වගකීම් සහිත හා කාර්යසාධනයට කැපවුණු කළමනාකාරීත්වයක් හා පාලනයක් තුළින් බලවත් සංස්ථාපිත වටිනාකම් සමුදායක් අනුගමනය කිරීම තුළින් සමාගම එහි සංස්ථාපිත පාලනය ආයතනගත කර ඇත්තේය. සමාගමේ ප්‍රතිරූපය ඉහළ නැංවෙන පරිදි ඉහළ කළමනාකාරීත්වය හා අධ්‍යක්‍ෂ මණ්ඩලය ඔවුන්ගේ රාජකාරී කටයුතුවලදී මෙන්ම සෙසු අවස්ථාවලදීද එම වටිනාකම් හොඳින් අනුගමනය කිරීමට කැප වී සිටී. එසේම සමාගම එහි සෑම කටයුත්තකදීම ඒකාබද්ධතාවේ ඉහළම ප්‍රමිතීන්, ආචාරධර්ම හා වෘත්තීයභාවය අනුව ක්‍රියා කිරීමට කැප වී සිටී.

සමාගමේ ව්‍යාපාර කටයුතු එහි කළමනාකරුවන්, නිලධාරීන් හා සේවකයින් විසින් / සභාපති / කළමනාකාර අධ්‍යක්‍ෂ ගේ මඟපෙන්වීම හා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ දුරදක්නා නුවණ මත සිදුකරගෙන යන්නේ සමාගමේ පාර්ශවකරුවන් වෙනුවෙන් එහි දිගුකාලීන අගය ඉහළ නැංවෙන ආකාරයෙනි. අධ්‍යක්‍ෂ මණ්ඩලය පාර්ශවකරුවන් වෙනුවෙන් ඉහළ වටිනාකමක් ලැබෙන පරිදි සිය වගකීම් ඉටුකිරීමට බැඳී සිටී. අධ්‍යක්‍ෂ මණ්ඩලය සමාගමේ සංස්ථාපිත ව්‍යාපාර කටයුතු අවබෝධ කරගැනීමට හොඳින් කැප වී සිටී. අධ්‍යක්‍ෂ මණ්ඩලය මාසිකව රැස්වී ඔවුන්ගේ පූර්ණ අවධානය පහත දැක්වෙන කරුණු කෙරෙහි යොමු කරති.


- උපාය මාර්ගික හා මෙහෙයුම් කරුණු සමාලෝචනය
- ලාභය, ශ්‍රම ප්‍රාග්ධනය හා මාසික කළමනාකරණ ගිණුම් සමාලෝචනය
- සභාපති / කළමනාකාර අධ්‍යක්‍ෂ මගින් ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ට උපදෙස් හා මාර්ගෝපදේශ සැපයීම
- පාර්ශවකරුවන්ට කාලීන හා වාරික වාර්තා සැපයීම හා සංසරණය
- ප්‍රධාන ආයෝජන සඳහා අනුමැතිය පළ කිරීම
- අන්තර්වාර හා වාර්ෂික වාර්තා අනුමත කිරීම

සමාගම හා පාර්ශවකරුවන් අතර ක්‍රියාකාරී සහයෝගීතාවය දිරිගන්වන පරිදි සියලුම පාර්ශවකරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අධ්‍යක්‍ෂ මණ්ඩලය කැප වී සිටී.

මූල්‍ය සහ මෙහෙයුම් විශේෂ අවස්ථා





වර්ෂය





වර්ෂය

## මූල්‍ය සහ මෙහෙයුම් විශේෂ අවස්ථා




වර්ෂය






වර්ෂය

| අගය එකතු කළ ප්‍රකාශනය | 2010 | 2009 |
|---|---|---|
| අගය එකතු කළ මුළු ආදායම | 13,181,556,160 | 5,891,107,664 |
| විකුණුම් පිරිවැය | (11,898,702,912) | (5,306,011,768) |
| මෙහෙයුම්වලින් අගය එකතු කිරීම | 1,282,853,248 | 585,095,895 |
| වෙනත් ආදායම් | 63,143,462 | 109,308,175 |
| එකතු කළ මුළු අගය | 1,345,996,710 | 694,404,070 |

**එකතු කළ අගය බෙදීයාම**

| | | | | |
|---|---|---|---|---|
| වැටුප් සහ වේතන | 447,605,754 | 33% | 267,784,064 | 39% |
| ක්ෂය වීම් | 50,824,064 | 4% | 21,275,987 | 3% |
| රඳවාගත් ලාභය | 37,867,417 | 3% | 21,363,971 | 3% |
| බදු | 181,438,719 | 13% | 71,408,847 | 10% |
| වියදම් ණයහිමියෝ | 628,260,756 | 47% | 312,571,201 | 45% |
| | 1,345,996,710 | | 694,404,070 | |



HLB Edirisinghe & Co
Chartered Accountants

**සීමාසහිත ලංකා සතොස කොටස් හිමියන් වෙත නිකුත් කරන ස්වාධීන විගණන වාර්තාව**

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව**

අප සමාගම සීමාසහිත ලංකා සතොස වෙනුවෙන් පහත දැක්වෙන මූල්‍ය ප්‍රකාශ විගණනයට ලක් කර ඇත. එනම් 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසරේ ශේෂ පත්‍රය හා ආදායම් ප්‍රකාශනය අදාළ වසරේ කොටස් හා මුදල් ප්‍රවාහය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සංක්ෂිප්ත වාර්තාවක් හා වෙනත් විග්‍රහාත්මක සටහන් ද ඊට ඇතුළත් වේ.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරීත්වයේ වගකීම**
ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කළමනාකාරීත්වය වගකීමෙන් බැඳී සිටී. ඒ අනුව මෙම මුදල් ප්‍රකාශන සැලසුම් කිරීම, වංචා හෝ වැරදි හේතුකොට මූර්ත අවප්‍රකාශවලින් තොරව, සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම එම වගකීමට අයත් වේ. එමෙන්ම එම මූල්‍ය ප්‍රකාශන සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගනිමින් ඒවා භාවිතයට ගෙන අවස්ථානුකූලව සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමද එම වගකීමට අයත් වේ.

**ගිණුම්කරණ විෂය පථය හා නිගමන පදනම**
අපේ වගකීම නම් මෙම මූල්‍ය ප්‍රකාශන කෙරෙහි අපේ විගණනය අනුව නිගමනයන් ප්‍රකාශ කිරීමයි. අපේ විගණන කටයුතු සිදු කෙරෙන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලවයි. එම ප්‍රමිතීන්ට අනුව අප සැලසුම් කොට විගණන කටයුතු සිදුකරන්නේ එකී මූල්‍ය ප්‍රකාශන මූර්ත අවප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ සහතිකයක් ලබාදීම සඳහාය. විගණනයකදී අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පරීක්ෂණ පදනම මත විමර්ශනය කිරීම, සංඛ්‍යාලේඛන සනාථ කරන සාක්ෂි හා අනාවරණ කිරීම් ආදිය ඇතුළත් වේ. විගණනයකදී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා කළමනාකාරීත්වය ඉදිරිපත් කර ඇති ගිණුම් පිළිබඳව තක්සේරු කිරීම හා සමස්ත මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කර ඇති ආකාරය පිළිබඳව ද සලකා බැලේ. ඊළඟ ඡේදයේ සාකච්ඡා කොට ඇති පරිදි අපේ විගණන කාර්යය සඳහා ප්‍රමාණවත් තරම් තොරතුරු හා විග්‍රහ කිරීම් ලබාගෙන නැත.

එබැවින් අපේ නිගමනය වියාචනය කිරීම සඳහා සාධාරණ පදනමක් මෙම අපේ විගණනය තුළින් සැපයෙන බව අපි විශ්වාස කරමු.

**නිගමනය වියාචනය කිරීමේ පදනම**
**දේපළ, පිරියත හා උපකරණ**

මෙම සමාගම දේපළ, යන්ත්‍රාගාර හා උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නැති අතර, කළමනාකාරීත්වය ඒ පිළිබඳ භෞතිකමය සංගණනයක් හා දේපළ තක්සේරු කිරීමක් 2010 දෙසැම්බර් 31 දක්වා සිදුකර නැත.

**තොගය**
ශේෂ පත්‍රයේ 2010 දෙසැම්බර් 31 දිනට සඳහන් අවසන් තොගයේ වටිනාකම රුපියල් 1,583,508,670 කි. එය මුළු වත්කම්වලින් සියයට 70 කි. 2010 දෙසැම්බර් 31 වන විට ශාඛා හා බඩු ගබඩා සැලකිය යුතු ප්‍රමාණයක භෞතික භාණ්ඩ ලැයිස්තු සංගණන වාර්තා ලබාගැනීමට අපට නොහැකි විය.

ප්‍රමාණවත් නොවන පාලනය, භාණ්ඩ ලැයිස්තු කෙරේ කළමනාකාරීත්වය ප්‍රමාණවත් වාරික අධීක්ෂණයන් සිදු නොකිරීම හා සමාගම පවත්වාගෙන ගොස් ඇති වාර්තාවල ආදිය නිසා විකල්ප මාර්ගවලින් ලබාගත් භාණ්ඩ ලැයිස්තු වටිනාකම් පිළිබඳව අපට සෑහීමකට පත්වීමට නොහැකිය.

**වවුචර ගෙවීම**
අපේ නියැදියට අනුව 2010 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වසර සඳහා ගෙවා ඇති රුපියල් 219,478,006 ට ගෙවීම් වවුචර අදාළ බලය ලත් නිලධාරියා විසින් සහතික කොට නැති බව අපට පෙනීගොස් ඇත.

**රජයේ අරමුදල**
2010 දෙසැම්බර් 31 දිනට රුපියල් 699,400,000 වන රජයේ අරමුදල් වර්ගීකරණය සත්‍යදැයි සොයාබැලීම සඳහා සෑහෙන හා සුදුසුතරම් සාක්ෂි ලබාගැනීමට අපට නොහැකිවිය.

**වෙළඳ සහ වෙනත් ලැබීම්**
2010 දෙසැම්බර් 31 දිනට රුපියල් 17,781,989.77 වන ලෙජරයේ හා ශාඛා මට්ටමින් ඇති බැර මැම පාලන ගිණුමේ වෙනස සඳහා සැසඳීමක් ලබාගැනීමට අපට නොහැකි විය.

2009 සිට ශාඛා මට්ටමින් උපලේඛනයක් නොමැතිවීම නිසා රුපියල් 38,093,892 වන ඌන ප්‍රේෂණ ආරම්භක ශේෂයේ සත්‍ය අසත්‍යභාවය සොයාබැලීමට අපට නොහැකිවිය.

## ස්වාධීන විගණන වාර්තාව

**සීමාසහිත ලංකා සතොස කොටස් හිමියන් වෙත නිකුත් කරන ස්වාධීන විගණන වාර්තාව**

**බැංකුවේ ඇති මුදල්**

සමාගම ක්‍රමානුකූලව බැංකු සැසඳීම් සකස්කොට ඒවා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු මගින් සමාලෝචනය කොට නොමැති අතර පුරුද්දක් ලෙස ජර්නල සටහන් මුදල් පොතට ඇතුළත් කොට ඇත. මෙය හොඳම ප්‍රතිපත්තියක් නොවේ.

**වත්මන් බදු**

ඉහත සඳහන් අව ප්‍රකාශවල බලපෑම් හේතුවෙන් වසර අවසානයේ සපයා ඇති ආදායම් බදු ප්‍රතිපාදනවල සාධාරණ බව සහතික කිරීමට අපට නොහැකිය.

**නිගමනය**

ඉහත සඳහන් කරුණුවල වැදගත්කම නිසා අපි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ නොකරමු.

**සෙසු නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 151 (2) කොටසේ අවශ්‍යතා වලට අනුකූල නොවේ.

එච්. එල්. බී. එදිරිසිංහ සහ සමාගම
වරලත් ගණකාධිකාරීවරු
කොළඹ.

2014 ජනවාරි 31



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

**සීමාසහිත ලංකා සතොස**
**ආදායම් ප්‍රකාශනය**
2010 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා

| | සටහන් | 2010<br>රු | 2009<br>රු |
|---|---|---|---|
| ආදායම | 03 | 13,034,080,622.52 | 5,806,399,470 |
| විකුණුම් පිරිවැය | | (11,898,702,912.18) | (5,306,011,768) |
| **දළ ලාභය** | | **1,135,377,710.34** | **500,387,701** |
| වෙනත් ආදායම් | 04 | 63,143,462.03 | 109,308,175 |
| බෙදාහැරීමේ වියදම් | | (814,061,802.10) | (456,566,926) |
| පරිපාලන වියදම | | (284,235,637.67) | (133,258,993) |
| වෙනත් මෙහෙයුම් වැය | 05 | (1,607,915.80) | - |
| **මෙහෙයුම්වලින් ලාභය** | 06 | **98,615,816.80** | **19,869,956** |
| මූල්‍ය වියදම් | 07 | (26,785,218.64) | (11,805,333) |
| **ආදායම් බදු ගෙවීමට පෙර ලාභය** | | **71,830,598.16** | **8,064,623** |
| ආදායම් බදු වියදම් | 08 | (33,963,181.44) | 13,299,347 |
| **ආදායම් බදු ගෙවීමෙන් පසු ලාභය** | | **37,867,416.72** | **21,363,971** |
| **කොටසක් සඳහා ඉපැයීම** | 09 | 5,409,630.96 | 3,051,996 |

වරහන් තුළ ඇති අගයන් අඩුකිරීම් හුවාදක්වයි.

15 සිට 25 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි වැදගත් කොටසක් නියෝජනය කරයි.

**සීමාසහිත ලංකා සතොස**
**2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය**

| සේවා වත්කම් | සටහන් | 31.12.2010 රු | 31.12.2009 රු |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 10 | 254,158,678.38 | 121,027,032 |
| ප්‍රමාද බදු වත්කම් | 11 | - | 17,086,672 |
| | | 254,158,678.38 | 138,113,704 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 12 | 1,583,508,670.38 | 783,237,566 |
| ස්ථාවර තැන්පතු | | 39,075,854.10 | 39,075,854 |
| වෙළඳ සහ වෙනත් ලැබීම් | 13 | 159,794,855.49 | 101,969,998 |
| ලැබි යුතු ආදායම් බදු | | 18,593,217.67 | 14,197,057 |
| ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු | | 14,464,141.82 | 4,625,410 |
| ආශ්‍රිත සමාගම්වලින් ලැබිය යුතු මුදල් - සතොස | 14 | 6,928,856.35 | 6,766,010 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 15 | 130,093,166.42 | 288,164,975 |
| | | 1,952,458,762.22 | 1,238,036,870 |
| මුළු වත්කම් | | 2,206,617,440.61 | 1,376,150,575 |
| **කොටස් හා බැරකම්** | | | |
| ප්‍රාග්ධන හා තැන්පතු | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 16 | 70.00 | 70 |
| රාජ්‍ය අරමුදල් | | 699,400,000.00 | 478,600,000 |
| රඳවාගත් ඉපැයුම් | | 23,916,016.26 | (13,951,400) |
| **කොටස් හිමියන්ගේ අරමුදල්** | | 723,316,086.26 | 464,648,670 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| ආශ්‍රිත සමාගම්වලට ගෙවිය යුතු මුදල් - සතොස | | 22,798,842.00 | 22,798,842 |
| විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් | 17 | 17,628,826.03 | 15,794,116 |
| | | 40,427,668.03 | 38,592,958 |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් | 18 | 1,024,640,778.01 | 672,790,127 |
| කෙටිකාලීන ණය | | 10,300,000.00 | 9,322,500 |
| බැංකු අයිරා | | 407,932,908.31 | 190,796,320 |
| | | 1,442,873,686.32 | 872,908,947 |
| **මුළු කොටස් හා බැරකම්** | | 2,206,617,440.61 | 1,376,150,575 |

15 සිට 25 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ වැදගත් කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඇත්තේ 2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ අවශ්‍යතාවලට අනුකූලවය.

.....................
මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී.

| | |
|---|---|
| ..................... | ..................... |
| අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත් කොටසකි.

**සීමාසහිත ලංකා සතොස**
**හිමිකම වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය**
**2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රජයේ අරමුදල් ගිණුම | රඳවාගත් ඉපැයීම් | මුළු ගණන |
|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 2009 ජනවාරි 01 ට ශේෂය | 70.00 | 334,599,930.00 | (35,315,371.10) | 299,284,628.90 |
| වසර සඳහා ලාභය | - | - | 21,363,970.64 | 21,363,970.64 |
| ලැබූ අරමුදල් | - | 144,000,070.00 | - | 144,000,070.00 |
| 2009 දෙසැම්බර් 31 ට ශේෂය | 70.00 | 478,600,000.00 | (13,951,400.46) | 464,648,669.54 |
| වසර සඳහා ලාභය | - | - | 37,867,416.72 | 37,867,416.72 |
| ලැබූ අරමුදල් | - | 220,800,000.00 | - | 220,800,000.00 |
| 2010 දෙසැම්බර් 31 ට ශේෂය | 70.00 | 699,400,000.00 | 23,916,016.26 | 723,316,086.26 |

වරහන් තුළ ඇති අගයන් අඩුකිරීම් හුවාදක්වයි.

15 සිට 25 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයේ වැදගත් කොටසකි.

**සීමාසහිත ලංකා සතොස**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**
**2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

| | 2010 | 2009 |
|---|---|---|
| මෙහෙයුම් කටයුතුවලින් එන මුදල් ප්‍රවාහ | රු. | රු. |
| බදු පෙර ලාභය | 71,830,598.16 | 8,064,623 |
| ගැලපීම් ඃ | | |
| ක්‍ෂයවීම් | 50,824,064.17 | 21,275,987 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 1,834,710.07 | 6,885,465 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය** | 124,489,372.40 | 36,226,075 |
| භාණ්ඩ ලැයිස්තුවල (වැඩිවීම) / අඩුවීම | (800,271,104.56) | (297,525,918) |
| වෙළඳ සහ වෙනත් ලැබීම්වල (වැඩිවීම) / අඩුවීම් | (67,663,589.27) | (18,228,728) |
| සමාගම් ශේෂයන් ආශ්‍රිත (වැඩිවීම) / අඩුවීම් | (162,846.20) | - |
| වෙළඳ සහ වෙනත් ගෙවීම්වල වැඩිවීම / (අඩුවීම්) | 351,850,651.17 | 473,545,259 |
| මෙහෙයුම්වලින් ඉපැයූ මුදල් (වැඩිවීම) / අඩුවීම් | (391,757,516.46) | 194,016,689 |
| ආර්ථික සේවා ගාස්තු ගෙවීම් | (20,700,862.00) | (9,708,882) |
| රඳවාගත් බදු මත ගෙවීම් | (472,346.00) | (520,989) |
| ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීම් | (99,462.00) | - |
| මෙහෙයුම් කටයුතුවලින් මුළු මුදල් ප්‍රවාහ / (යන ප්‍රවාහ) | (413,030,186.46) | 183,786,818 |
| **ආයෝජන කටයුතුවලින් යන මුදල් ප්‍රවාහ** | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | (183,955,710.00) | (78,918,153) |
| ස්ථාවර තැන්පතු ආයෝජන | - | (6,525,854) |
| ආයෝජන කටයුතුවලින් එන මුළු මුදල් ප්‍රවාහ / (යන ප්‍රවාහ) | (183,955,710.00) | (85,444,007) |
| **මූල්‍ය කටයුතුවලින් යන මුදල් ප්‍රවාහ** | | |
| භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් | 220,800,000.00 | 144,000,070 |
| ලැබුණු / (ආපසු ගෙවූ) කෙටිකාලීන ණය | 977,500.00 | 2,333,000 |
| මූල්‍ය කටයුතුවලින් එන මුළු මුදල් ප්‍රවාහ | 221,777,500.00 | 146,333,070 |
| **මුදල් සහ මුදල් සමාන දෑ මුළු වැඩිවීම (අඩුවීම)** | (375,208,396.46) | 244,675,881 |
| **වසර ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ ලැබීම්** | 97,368,654.57 | (147,307,227) |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ ලැබීම්** | (277,839,741.89) | 97,368,655 |

**සටහන A - මුදල් හා සමාන දෑ**

| | | |
|---|---|---|
| බැංකුවේ ඇති මුදල් | 18,886,123.70 | 198,001,419 |
| අතේ ඇති මුදල් | 111,207,042.72 | 90,163,556 |
| බැංකු අයිරා | (407,932,908.31) | (190,796,320) |
| | (277,839,741.89) | 97,368,655 |

වරහන් තුළ ඇති අගයන් අඩුකිරීම් හුවාදක්වයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්කරණ සඳහා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත් කොටසකි.



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

සීමාසහිත ලංකා සතොස
මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති
2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

**1. සංස්ථාපිත තොරතුරු**

**1.1 පොදු**
සීමාසහිත ලංකා සතොස සීමිත බැරකම් සහිත ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමකි.
එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 01, යෝක් වීදිය, අංක. 108 දරන ස්ථානයේ පිහිටා තිබේ. සමාගමේ ප්‍රධාන කාර්යය නම් පාරිභෝගික නිෂ්පාදන සිල්ලර හා තොග වෙළඳාමයි.

**1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය**
වසර තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ පාරිභෝගික භාණ්ඩ තොග හා සිල්ලර වෙළඳාමයි.

**2. වැදගත් ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය**

**2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.1.1 සකස්කිරීමේ පදනම**
ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය දක්වා ඇති ප්‍රමිතීන්ට අනුකූලව පවත්නා වැය පදනම යටතේය.

**2.1.2 අනුගතවීමේ ප්‍රකාශනය**
2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා සමාගමේ ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් (මූල්‍ය ප්‍රකාශන) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව සකස් කොට ඇත. සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිගත් වැය සම්මුතිය යටතේ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කොට ඇත.

**2.1.3 නිකුත්කිරීම සඳහා බලය ලබාදී ඇති දිනය**
අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා 2014 ජනවාරි 31 දින බලය ලබාදී ඇත.

**2.1.4 අඛණ්ඩ පැවැත්ම**
සමාගමේ අධ්‍යක්‍ෂවරු සමාගම අඛණ්ඩ ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ තක්සේරුවක නිරතව සිටින අතර සමාගමේ වෙළඳාම් නතර කිරීමට හෝ සමාගම ඈවර කිරීමට හෝ අපේක්‍ෂා නොකරති.

**2.1.5 සංසන්දනාත්මක තොරතුරු**
සමාගම විසින් නිරතුරුවම මෙම ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය කර ඇති අතර, පසුගිය කාලය පුරා එය අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත. වත්මන් කාලයේ ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල ඉකුත් සමයේ සංඛ්‍යා හා වාක්‍යාංශ යළි සකස්කොට යොදා ඇත.

**2.1.6 විදේශ මුදල් පරිවර්තනය**
සියලු විදේශ මුදල් ගනුදෙනු මෙහි වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලට හරවා ඇති අතර ඒ සඳහා අදාළ ගනුදෙනු සිදුවන අවස්ථාවේ පැවති විනිමය අනුපාතයන් සැලකිල්ලට ගෙන ඇත.

සීමාසහිත ලංකා සතොස
මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති
2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

**2.2. වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම්**

**2.2.1. දේපළ පිරියත හා උපකරණ**
**(අ) පිරිවැය**
දේපළ පිරියත හා උපකරණ සඳහන් කර ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් හා ඒවායේ පිරිවැයෙන් ඒකරාශී වටිනාකම් හානිවීම් අඩුකොට සැලකිල්ලට ගනිමිනි.

**(ආ) ක්ෂයවීම්**
ක්ෂයවීම් ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ ඇස්තමේන්තු ගත භාවිතාකළ හැකි කාලසීමාව හා පහත දැක්වෙන වාර්ෂික ක්ෂයවීම් ප්‍රතිශතයන් සැලකිල්ලට ගෙන සරල රේඛීය ක්ෂයවීම් පදනම යටතේය.
භාවිතාකළ ප්‍රධාන වාර්ෂික ක්ෂයවීම් අනුපාතයන් පහත දැක්වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| පරිගණක | 25% |
| සන්නිවේදන උපකරණ | 20% |
| ගෘහභාණ්ඩ හා මෙවලම් | 20% |
| මෝටර් රථ | 20% |
| සතොස වත්කම් | 17.5% |

දේපළ ක්ෂයවීම් ආරම්භ වන්නේ එම දේපොළ ප්‍රයෝජනයට ගත් දින සිටය.

සෑම මුදල් වර්ෂයකදීම දේපළවල ඉතිරි අගයන් ප්‍රයෝජනයට ගතහැකි කාලසීමාව හා ක්ෂයවීම් ක්‍රමවේද සුදුසු පරිදි සමාලෝචනය කොට ගලපාගන්නා ලදී.

**(ඇ) ප්‍රතිෂ්ඨාපන පිරිවැය**
මූලික වශයෙන් තක්සේරු කරන ලද කාර්ය සාධන ප්‍රමිතීන් තුළින් අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ යළි ස්ථාපනය කිරීමට හෝ පවත්වාගෙන යාම සඳහා දේපළ, පිරියත හා උපකරණ අලුත්වැඩියාව හෝ නඩත්තුව වෙනුවෙන් දරන ලද වියදම ඒ ඒ අවස්ථාවේ දරන ලද වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

**(ඈ) අව-පිළිගැනීම**
කිසියම් දේපළක් පිරියතක් හෝ උපකරණයක් අවපිළිගැනීමට ලක් කරනු ලබන්නේ එය ඉවත් කරනු ලබන විට හෝ එය භාවිතයෙන් හෝ ඉවත් කිරීමෙන් අනාගත ආර්ථික වාසියක් නොලැබෙන අවස්ථාවකදීය. කිසියම් දේපළක් අවපිළිගැනීමේදී මතුවන ලාභය හෝ පාඩුව මුළු බැහැර කිරීම් ක්‍රියාවලිය හා පවතින ප්‍රමාණය අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ.

**2.2.2 තොගය**
සෙමෙන් අලෙවි වන අභාවිත භාණ්ඩ කෙරෙහි ඉඩහරිමින් අවම වැය හා සාක්ෂාත් කරගත හැකි ශුද්ධ අගය මත අවසන් තොගය සඳහන් කර ඇත. සාමාන්‍ය වෙළඳාමේදී ලැයිස්තුගත භාණ්ඩ අලෙවි කෙරෙන්නේ පූර්ණ තක්සේරු වැය හා අලෙවිය පවත්වාගෙන යාමට අවශ්‍ය ඇස්තමේන්තු වැයට අඩුවෙන් ඒ ඒ අවස්ථාවේ සාක්ෂාත් කර ගත හැකි ශුද්ධ අගය මතය.



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

සීමාසහිත ලංකා සතොස
මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති
2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

**2.2.3 වෙළඳ හා වෙනත් ලැබීම්**
වෙළඳ හා වෙනත් ලැබීම් ප්‍රකාශිතව ඇත්තේ බොල් සහ අඩමාණ ණය ලැබීම් සඳහා සාක්ෂාත් කර ගත හැකි ප්‍රතිපාදන තක්සේරු කරගැනීමෙන් පසුවය. අදාළ පාර්ශවකරුවන්ගෙන් ලැබිය යුතු වෙනත් ලැබීම් හඳුන්වනු ලබන්නේ බොල් සහ අඩමාණ ණය ලැබීම් සඳහා වැය ප්‍රතිපාදන අඩුකිරීමට යටත්වය.

**2.2.4 මුදල් හා මුදල් සමාන දෑ**
මුදල් හා මුදල් සමාන දෑ ලෙස අර්ථ දැක්වෙන්නේ අතේ ඇති මුදල්, ඉල්ලුම් තැන්පත් හා කෙටිකාලීන දැඩි ද්‍රවශීල ආයෝජන, පහසුවෙන් මාරුකළ හැකි බවට හඳුනාගත් මුදල් හා අගය වෙනස්වීමේ අවදානමට ඉතා සුළුවෙන් ලක් වූ මුදල්ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය උදෙසා මුදල් හා මුදල් සමාන දෑ ලෙස අතේ ඇති මුදල් හා බැංකු තැන්පතු, හිඟව තිබෙන බැංකු අයිරා, කෙටිකාලීන කල්පිරීම් සහිත ආයෝජන ද (උදා. තුන් මාසයක් හෝ ඊට අඩු කාලයකින් යළි අත්පත් කරගත හැකි) සලකනු ලැබේ.

**2.2.5 ආයෝජන**
වත්මන් ආයෝජන වටිනාකම මත ප්‍රකාශිතව ඇත.

**2.3 බැරකම්**
ශේෂ පත්‍රයේ වත්මන් බැරකම් යටතේ ප්‍රකාශිත බැරකම් යනු ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත ලැබීමට අපේක්ෂිත ඒවාය. දිගු කාලීන බැරකම් ලෙස ප්‍රකාශිත අයිතම නම් ශේෂ පත්‍රයේ දිනට වසරකට පසු කාල සීමාවේදී ලැබීමට අපේක්ෂිත ඒවාය.

**2.3.1 වෙළඳ සහ වෙනත් ගෙවීම්**
වෙළඳ ණය හිමියන් හා වෙනත් ගෙවීම් ඒවායේ පොත් අගය සඳහන් කෙරේ.

**2.3.2 ප්‍රතිපාදන**
අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමාගමට වත්මන් බැඳීමක් (නෛතික හෝ අර්ථදායක) ඇතිවිට ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. එහිදී සමාගමේ බැඳීම් නිරාකරණය සඳහා සමාගමට ආර්ථික ප්‍රතිලාභ උදා කෙරෙන සම්පත් ගලායාම අවශ්‍ය කෙරේ. එමෙන්ම එම බැඳීමේ ප්‍රමාණයද විශ්වාසනීය තක්සේරුවක් එම ප්‍රතිපාදන මගින් සිදුකළ හැකිය.

**2.3.2.1. පාරිතෝෂික ප්‍රතිපාදන**

**(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික**
1983 අංක 12 පාරිතෝෂික පනතේ (ස.ල.ප.සේ) 16 ට සමානුරූපීව වට්ටෝරු ක්‍රමය භාවිතයෙන් විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසා නැත.

කෙසේ වෙතත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතට අනුව සේවකයෙක් පාරිතෝෂික සඳහා හිමිකම් ලබන්නේ නොකඩවා වසර 5ක සේවාවක් නිමකළහොත් පමණි. මෙම බැරකම් බාහිර වශයෙන් ප්‍රතිපාදනය නොවේ. මෙම අයිතමය ශේෂ පත්‍රයේ ජංගම නොවන බැරකම් ගණයට අයත් කොට ඇත. භාවිතා කළ ප්‍රධාන උපකල්පන අංක 17 සටහනේ අනාවරණය කොට ඇත.

**(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්**
සේවක අර්ථසාධක අරමුදල (EPF) හා සේවක භාරකාර අරමුදල (ETF)
අදාළ අණ පනත් හා රෙගුලාසිවලට අනුකූලව සේවකයෝ සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලේ දායකත්වයට සුදුසුකම් ලබා සිටිති. සමාගම සේවකයින්ගේ දළ වැටුප මෙන් සියයට 12 කින් සේවක අර්ථසාධක අරමුදල සඳහා ද සියයට 3 කින් සේවක භාරකාර අරමුදල සඳහාද දායක වෙයි.

**සීමාසහිත ලංකා සතොස**
**මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

**2.3.2.2 බදුකරණය**
**(අ) වත්මන් බදු**
ආදායම් බදු ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කොට ඇති පරිදි ආදායම් හා වියදම් මූලිකාංග මත පදනම්ව සකස් කොට ඇති අතර, 2006 අංක 10 දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව ගණනය කෙරේ.

**(ආ) විලම්භිත බදු**
ශේෂ පත්‍රයේ පවත්නා වත්කම් හා බැරකම් හා බදු කටයුතු සඳහා ආරෝපිත එවැනි වත්කම් හා බැරකම් ප්‍රමාණය අතර තාවකාලික වෙනස මත විලම්භිත බදු හඳුනාගනු ලැබේ.

ක්‍රියාත්මකව පවතින හෝ ශේෂ පත්‍රයේ දිනට ක්‍රියාත්මකව පවතින බදු අනුපාතයන් භාවිතයෙන් විලම්භිත බදු ගණනය කරනු ලබන අතර, වත්කම් යතාවත් වන හෝ බැරකම් නිරාකරණය වන කාලසීමාවේදී එය අදාළ කරගනු ලැබේ. පවත්නා විලම්භිත බදු බැරකම්වල මුළු වැඩිවීම හා විලම්භිත බදු වත්කම් වැඩිවීම විලම්භිත බදු වියදම ලෙස හඳුනාගනු ලබන අතර, අනික් අතට කිසියම් අඩුවීමක් ඇති වුවහොත් එය ප්‍රත්‍යාවර්තිතව ආදායම් ප්‍රකාශනයේ විලම්භිත බදු ආදයම ලෙස සලකනු ලැබේ.

සමාගමේ ලාභය හා ආදායම්, දේශීය ආදායම් පනතේ 7 කොටසට අනුව 2011 සිට බලපැවැත්වෙන පරිදි ආදායම් බද්දෙන් නිදහස් කොට ඇති නිසා විලම්භිත බදු සපයා නැත.

**2.4 ආදායම් ප්‍රකාශනය**
**2.4.1 ආදායම් පිළිගැනීම**

**(අ) භාණ්ඩ අලෙවිය**
ආදායම් හඳුනාගනු ලබන්නේ සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ සම්භාව්‍යතාව අනුවය. ආදායම් හා දරන ආශ්‍රිත වියදම් විශ්වාසනීය ලෙස ගණනය කළ හැකිය. ආදායම මනිනු ලබන්නේ ලැබිය හැකි මුළු වෙළඳ වට්ටම් හා අලෙවි බදුවල සාධාරණ අගය සැලකිල්ලට ගැනීමෙනි.

**(ආ) පොලිය**
පොලී ආදායම හඳුනාගනු ලබන්නේ එක්රැස්කරගැනීම සැකසහිත නොවන විට එකතු වූ පොලිය මතය.

**(ඇ) වෙනත්**
වෙනත් ආදායම් හඳුනාගනු ලබන්නේ එකතුවන පදනම මතය.

දේපළ, පිරියත උපකරණ හා ආයෝජන ඇතුළු වෙනත් ජංගම නොවන වත්කම් බැහැර කිරීම මත ආදායම් ස්වභාවයේ සිදුවන ශුද්ධ ලාභය සහ පාඩු පිළිබඳව ආදායම් ප්‍රකාශනයේ හේතු දක්වා ඇත.

**2.4.2. වියදම් හඳුනාගැනීම**
ආදායම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගනු ලබන්නේ දරන ලද වැය හා විශේෂිත ආදායම් අයිතම, ලද ඉපැයීම් අතර සෘජු සම්බන්ධතා පදනම යටතේය. ව්‍යාපාර පවත්වාගෙන යාමේදී හා දේපළ, පිරියත හා උපකරණ කාර්යක්ෂම ලෙස නඩත්තු කිරීමේදී දරනා ලද සියලු වියදම් වසරේ ලාභය සඳහා හේතු වූ ආදායමක් බවට හරවා තිබේ.

ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කටයුත්ත වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය දරන මතය නම් එහි වියදම් මෙහෙයුම් ක්‍රමවේදය සමාගමේ කාර්ය සාදන මූලික ප්‍රතිපත්තිවලට සාධාරණ වන බවයි. ඒ අනුකූලව ඉදිරිපත් කිරීම් ක්‍රමවේදය භාවිතා කළ බව අධ්‍යක්ෂ මණ්ඩලයේ පිළිගැනීමයි.

**2.5 ශේෂ පත්‍රයෙන් බැහැර වූ හා ආදායම් ප්‍රකාශනයේ අයිතම**

**2.5.1 ශේෂ පත්‍රයෙන් පසුව සිදුවූ අවස්ථා**
ශේෂ පත්‍රය නිමකළ දිනට පසුව සිදුවූ සියලු භෞතික සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර අවස්ථානුකූලව අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණ කිරීම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන් යටතේ ඇතුළත් කොට ඇත.

**2.5.2 අවිනිශ්චිත අවස්ථා සහ හඳුනා නොගත් ගිවිසුම්කර බැඳීම්.**
අවිනිශ්චිත අවස්ථා යනු අතීත සිදුවීම් අනුව මතුවිය හැකි වත්කම් හෝ බැඳීම් වන අතර, ඒවා සමාගමේ පාලනයට නතු නොවන මෙන්ම සිදුවීම හො සිදු නොවීම මත පමණක් තහවුරු කරගත හැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් වේ.

සීමාසහිත ලංකා සතොස
මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ සටහන්
2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

| | 2010 | 2009 |
|---|---|---|
| | රු. | රු. |
| **සටහන - 3. ආදායම** | | |
| ආදායම | 13,181,556,159.82 | 5,891,107,664 |
| අඩුකල ඃ පිරිවැටුම් බද්ද | (147,475,537.30) | (84,708,194) |
| | 13,034,080,622.52 | 5,806,399,470 |
| **සටහන - 4. වෙනත් ආදායම්** | | |
| වෙළඳ ප්‍රචාරණ ප්‍රතිපූරණය | 363,253.91 | 3,875,530 |
| පරිත්‍යාග | - | 4,370,500 |
| විනිමය ලැබීම් | - | 94,399 |
| ගොන්ඩෝලා ආදායම | 18,084,246.92 | 1,222,500 |
| රක්‍ෂණ වන්දි ලැබීම් | 98,697.20 | 1,729,391 |
| ඇමතුම් තැන්පතු පොලී | 1,690,694.20 | 184,925 |
| ස්ථාවර තැන්පතු පොලී | 1,895,025.00 | 5,279,839 |
| යාපනයට බඩු ප්‍රවාහන ආදායම් | - | 66,617,237 |
| පෙර වසරේ ගැළපීම් | 633,682.35 | - |
| අලෙවි ප්‍රවර්ධනය | 3,873,262.42 | 7,564,256 |
| මුක්තාවශේෂ ආදායම | 3,495,161.06 | - |
| යළි අත්කරගත් තොග හිඟ | 545,348.52 | - |
| විවිධ ආදායම් | 5,892,316.67 | 2,695,341 |
| යළි අත්කරගත් දුරකථන ගාස්තු | 4,965.29 | 28,483 |
| ප්‍රවාහන ආදායම | 20,943,764.19 | 13,599,490 |
| ආපසු ලිඛිත හඳුනානොගත් ශේෂය | - | 2,046,283 |
| ආපසු ලිඛිත සංචරණ නොවන ශේෂය | 5,623,044.30 | - |
| | 63,143,462.03 | 109,308,175 |
| **සටහන - 05 වෙනත් මෙහෙයුම් වියදම්** | | |
| අත්හැර දැමූ මුදල් පාලන ගිණුම් ශේෂය | 139,874.08 | - |
| ඉවත්කළ සංචරණ නොවන ශේෂය | 1,458,240.16 | - |
| ඉවත්කළ රැඳවුම් බද්ද | 9,801.56 | - |
| | 1,607,915.80 | - |



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

**සීමාසහිත ලංකා සතොස**
**මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ සටහන්**
**2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**

| | 2010<br>රු. | 2009<br>රු. |
|---|---|---|
| **සටහන -6. මෙහෙයුම්වලින් ලද ලාභය ප්‍රකාශිතව ඇත්තේ පහත සඳහන් වියදම් ඇතුලු සියළු වියදම් අයකර ගැනීමෙන් පසුවයි.** | | |
| වැටුප් | 340,254,301.30 | 202,978,592 |
| අතිකාල | 52,895,986.61 | 25,132,607 |
| සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් | 31,138,331.20 | 18,775,194 |
| සේවක භාරකාර අරමුදල් ගෙවීම් | 7,777,258.59 | 4,768,948 |
| විගණනකරුවන්ගේ වැටුප් | 1,125,015.00 | 510,900 |
| ක්ෂය වීම් | 50,824,064.17 | 21,275,987 |
| තොග පාඩු | - | 20,000,000 |
| නිශ්චිත ප්‍රතිලාභ වැය / පාරිතෝෂික | 1,834,710.07 | 6,885,465 |
| ප්‍රසාද දීමනා | 6,032,850.00 | 3,919,291 |

| | 2010 | 2009 |
|---|---|---|
| **සටහන 7 - මූල්‍ය වැය** | | |
| හර බදු | 10,468,384.12 | 3,636,507 |
| බැංකු ගෙවීම් හා කොමිස් | 13,747,724.48 | 7,162,807 |
| ණය පොලී | 2,569,110.04 | 1,006,019 |
| | 26,785,218.64 | 11,805,333 |

| | 2010 | 2009 |
|---|---|---|
| **සටහන 8 - ආදායම් බදු වියදම්** | | |
| වත්මන් ආදායම් බදු ප්‍රතිපාදන | 16,876,509.68 | 540,807 |
| ප්‍රමාද බදු ප්‍රතිපාදන | 17,086,671.76 | (13,840,154) |
| | 33,963,181.44 | (13,299,347) |

**සටහන 9**

සාමාන්‍ය කොටසක් සඳහා මූලික ඉපැයීම් / පාඩුව ගණනය කරනු ලබන්නේ වසර සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපනය වන ශුද්ධ ලාභය (පාඩුව) ශේෂ පත්‍රයේ දිනට නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් ප්‍රමාණයෙන් බෙදනු ලැබීමේ පදනම මතය.

| | 2010 | 2009 |
|---|---|---|
| **ලවය ලෙස භාවිත ප්‍රමාණය** | | |
| සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපිත ලාභය /(පාඩුව) | 37,867,416.72 | 21,363,971 |
| **හරය ලෙස භාවිත සාමාන්‍ය කොටස් සංඛ්‍යාව** | 7 | 7 |
| නිකුත් කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | 5,409,630.96 | 3,051,995 |
| කොටසක මූලික ඉපැයීම (රු) | | |

සීමාසහිත ලංකා සතොස
2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

| 10. දේපළ පිරියත හා උපකරණ | 2010.01.01ට ශේෂය | එකතුකිරීම් | 2010.12.31ට ශේෂය |
|---|---|---|---|
| **පිරිවැය** | රු. ශත | රු. ශත | රු. ශත |
| ඉඩම් | 1,425,000.00 | - | 1,425,000.00 |
| ගොඩනැගිලි | 3,987,517.50 | 12,909,569.00 | 16,897,086.50 |
| මෝටර් වාහන | 5,521,440.00 | - | 5,521,440.00 |
| පරිගණක උපකරණ | 18,537,664.71 | 7,228,598.84 | 25,766,263.55 |
| කාර්යාල උපකරණ | 99,009,359.51 | 161,162,814.82 | 260,172,174.33 |
| ගෘහභාණ්ඩ හා මෙවලම් | 4,568,141.61 | 2,271,574.00 | 6,839,715.61 |
| සන්නිවේදන උපකරණ | 2,347,071.38 | 383,153.34 | 2,730,224.72 |
| සතොස වත්කම් | 25,953,339.17 | - | 25,953,339.17 |
| | 161,349,533.88 | 183,955,710.00 | 345,305,243.88 |
| **සමුච්ත ක්ෂයවීම්** | | | |
| | - | | |
| ගොඩනැගිලි | - | 1,044,230.20 | 1,044,230.20 |
| මෝටර් වාහන | 1,633,045.00 | 1,104,288.00 | 2,737,333.00 |
| පරිගණක උපකරණ | 4,075,121.93 | 5,385,767.01 | 9,460,888.94 |
| කාර්යාල උපකරණ | 15,719,548.96 | 37,092,671.05 | 52,812,220.01 |
| ගෘහභාණ්ඩ හා මෙවලම් | 3,270,420.61 | 1,124,831.26 | 4,395,251.86 |
| සන්නිවේදන උපකරණ | 1,287,804.67 | 512,508.08 | 1,800,312.75 |
| සතොස වත්කම් | 14,336,560.15 | 4,559,768.59 | 18,896,328.74 |
| | 40,322,501.32 | 50,824,064.17 | 91,146,565.50 |
| **ශුද්ධ අගයන්** | | | |
| ඉඩම් | 1,425,000.00 | | 1,425,000.00 |
| ගොඩනැගිලි | 3,987,517.50 | | 15,852,856.30 |
| මෝටර් වාහන | 3,888,395.00 | | 2,784,107.00 |
| පරිගණක උපකරණ | 14,462,542.78 | | 16,305,374.61 |
| කාර්යාල උපකරණ | 83,289,810.55 | | 207,359,954.32 |
| ගෘහභාණ්ඩ හා මෙවලම් | 1,297,721.00 | | 2,444,463.75 |
| සන්නිවේදන උපකරණ | 1,059,266.71 | | 929,911.97 |
| සතොස වත්කම් | 11,616,779.02 | | 7,057,010.43 |
| | 121,027,032.46 | | 254,158,678.38 |



ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

| සීමාසහිත ලංකා සතොස<br>2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | 31.12.2010<br>රු. | 31.12.2009<br>රු. |
|---|---|---|
| **11. විලම්භිත බදු ප්‍රතිපාදන** | | |
| වසර මුල ශේෂය | 17,086,671.76 | 3,246,518 |
| වත්කම් ප්‍රකාශනයෙන් / (ට) මාරු කළා | (17,086,671.76) | 13,840,154 |
| වසර අවසානයේදී ශේෂය | - | 17,086,672 |
| **12. තොගය** | | |
| ප්‍රතිපාදන අයිතම | 866,440,321.85 | 452,509,876 |
| ග්‍රොසරි අයිතම | 661,221,476.76 | 287,934,712 |
| සංක්‍රමණික තොගය | 18,055,796.94 | 11,532,374 |
| මත්පැන් | 37,791,074.83 | 31,260,604 |
| | 1,583,508,670.38 | 783,237,566 |
| **13. වෙළඳ සහ වෙනත් ලැබීම්** | | |
| මුදල් මැම පාලනය | 9,853,732.91 | 25,134,277 |
| කාඩ්පත් පාලනය | 601,476.42 | 65,872 |
| චෙක්පත් පාලනය | 188,616.50 | (376,425) |
| බිත්තර හා පොල් මිලදීගැනීම් පාලනය | - | 247,091 |
| ආශ්චර්යා ඉතුරුම් පත් | 500,000.00 | - |
| ආපදා ණය | 158,347.95 | 420,290 |
| මත්පැන් බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු පෙර ගෙවීම් | (123,000.00) | 1,946,481 |
| වෙනත් ලැබීම් - කොටස් සඳහා | 70.00 | 70 |
| ණය සහ අත්තිකාරම් | - | 19,365 |
| පොලිස් දෙපාර්තමේන්තුව | - | 10,413 |
| පෙර ගෙවුම් බදු | - | 4,637,816 |
| මිලදී ගැනීම් අත්තිකාරම් | - | 1,500,000 |
| බැංකු ආරක්ෂණ ලැබීම් | 341,681.80 | 515,182 |
| ආපසු ගෙවනු ලබන තැන්පතු | 52,664,101.64 | 26,680,598 |
| කුලී අත්තිකාරම් | 2,268,155.34 | 1,755,739 |
| කුලී තැන්පතු | 2,201,202.77 | 610,813 |
| කුලී පෙරගෙවුම් | 24,961,929.99 | - |
| නැව් ගාස්තු සුරැකුම් | - | 89,867 |
| තොග හානි යළි අත්කර ගැනීම | - | 139,560 |
| තොග හිඟ යළි අත්පත් කරගැනීම | - | 9,802 |
| ලංකා සතොස සුභසාධක සංගමය | 63,581,942.82 | 38,093,893 |
| අවප්‍රේෂණය | 170,796.60 | 170,797 |
| නොපියවූ අරමුදල් | (333,700.00) | 298,500 |
| උත්සව අත්තිකාරම් පාලනය | 2,300,000.00 | - |
| ගොඩනැගිලි ඉදිකිරීම් අත්තිකාරම් | 459,500.75 | - |
| තැගි වවුචර නිකුත් කිරීම පාලනය | | |
| | 159,794,855.49 | 101,969,998 |

ලංකා සතොස
අභිමානයෙන් ඉදිරියට

සීමාසහිත ලංකා සතොස
2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

| | 31.12.2010 | 31.12.2009 |
|---|---|---|
| | රු. | රු. |
| **14. ආශ්‍රිත සමාගම්වලින් ලැබිය යුතු දේ** | | |
| සමුපකාර තොග වෙළඳ සංස්ථාව | 6,928,856.35 | 6,766,010 |
| | 6,928,856.35 | 6,766,010 |
| **15. මුදල් හා මුදල් සමාන දේ** | | |
| මහජන බැංකුව - ඉතිරිකිරීමේ ගිණුම | 6,257,589.31 | 51,846,618 |
| මහජන බැංකුව - මාස්ටර් කාඩ් | 5,392,278.38 | 20,792,722 |
| මහජන බැංකුව - ජංගම ගිණුම | - | 124,858,959 |
| අත්මුදල් අත්තිකාරම් | 562,347.08 | 69,622 |
| මුදල් පාලනය | 109,348,940.84 | 89,255,439 |
| ඉපිලෙන මුදල් | 1,295,754.80 | 838,495 |
| ණයකර ලිපි මුදල් තැන්පතු | 7,236,256.01 | 503,120 |
| | 130,093,166.42 | 288,164,975 |
| **16. ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | |
| නිකුත්කළ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 70.00 | 70 |
| | 70.00 | 70 |
| **17. විශ්‍රාම පාරිතෝෂික බැඳීම්** | | |
| වසර මුලදී ශේෂය | 15,794,115.96 | 8,908,651 |
| වසර සඳහා ප්‍රතිපාදන | 1,834,710.07 | 6,885,465 |
| | 17,628,826.03 | 15,794,116 |
| **ගෙවීම්** | - | - |
| වසර අවසානයේ ශේෂය | 17,628,826.03 | 15,794,116 |

**උපකල්පන**

වාර්තාකරණ කාලසීමාවේදී ප්‍රධාන උපකල්පන පහත දැක්වේ

| | |
|---|---|
| වට්ටම් අනුපාතය | 10.4% |
| අපේක්ෂිත වැටුප් වර්ධක | 3% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් | 5% |
| සේවකයින්ගේ උපරිම විශ්‍රාම වයස | අවුරුදු 55 |

| | 31.12.2010 | 31.12.2009 |
|---|---|---|
| **18 - වෙළඳ සහ වෙනත් ගෙවීම්** | | |
| වෙළඳ ණය හිමියෝ | 874,965,736.21 | 577,512,525 |
| වෙනත් ණය හිමියෝ | 25,354,476.72 | 16,724,082 |
| වියදම් ණය හිමියෝ | 62,799,364.05 | 36,016,571 |
| තෑගි වවුචර් නිකුතු පාලනය | - | 352,044 |
| පිරිවැටුම් බදු ගෙවීම් | 40,828,011.04 | 25,466,945 |
| ආර්ථික සේවා ගාස්තු ගෙවීම් | 9,838,731.76 | 4,655,410 |
| දේශීය මිලදීගැනීම් අත්තිකාරම් | 4,309,327.79 | 8,616,214 |
| ආරක්ෂණ තැන්පතු | 3,019,500.00 | 2,439,500 |
| පරිගණක මෘදුකාංග සඳහා ගෙවීම් | 1,406,720.38 | 20,000 |
| වැට් රැඳවුම් - එකතු කළ අගය මත බදු (VAT) | 510,265.02 | 241,222 |
| ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීම් | 156,022.11 | 199,747 |
| රඳවාගැනීමේ බදු ගෙවීම් | 1,452,623.03 | 545,866 |
| | 1,024,640,778.01 | 672,790,127 |

සීමාසහිත ලංකා සතොස
2010 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

| | | **31.12.2010** | **31.12.2009** |
|---|---|---|---|
| | | රු. | රු. |

**19. ඇපයට තබන ලද**

බැරකම් ආරක්ෂණ ලෙස පහත සඳහන් වත්කම් පොරොන්දු වී ඇත

| වත්කමේ ස්වභාවය | බැරකමේ ස්වභාවය | 31.12.2010 රු. | 31.12.2009 රු. |
|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | බැංකු අයිරා පහසුකම් | 39,075,854 | 39,075,854 |

**20. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

ශේෂ පත්‍ර දිනය වනවිට ශ්‍රී ලංකා සතොස ශාඛා 219 ක් මෙහෙයවූ අතර එම දිනට පසුව ශාඛා 49 ක් විවෘත කර තිබේ. ඒ අනුව විගණන වාර්තා දිනය වනවිට ශාඛා 268 ක් මෙහෙයවමින් පවතී.

**21. සම්බන්ධිත පාර්ශවකරුවන්ගේ ගනුදෙනු**

සමාගමේ කිසිදු අධ්‍යක්ෂවරයෙක් දැනට සමාගමේ පවතින හෝ යෝජිත කොන්ත්‍රාත් සඳහා සෘජුව හෝ වක්‍රව සම්බන්ධකම් නොපවත්වයි.

# සීමාසහිත ලංකා සතොස

2010 දෙසැම්බර් 31 ට දිවයින පුරා ශාඛා ජාලය

| | |
|---|---|
| 1 | මාරවිල |
| 2 | මීගමුව |
| 3 | පිළියන්දල |
| 4 | රත්නපුර |
| 5 | හලාවත |
| 6 | අවිස්සාවේල්ල |
| 7 | ඇඹිලිපිටිය |
| 8 | කතරගම |
| 9 | බුත්තල |
| 10 | තිස්සමහාරාම |
| 11 | තංගල්ල |
| 12 | බෙලිඅත්ත |
| 13 | හම්බන්තොට |
| 14 | අම්බලන්තොට |
| 15 | ඇහැලියගොඩ |
| 16 | මාලිම්බඩ |
| 17 | අකුරැස්ස |
| 18 | පුත්තලම |
| 19 | අනුරාධපුර |
| 20 | කැකිරාව |
| 21 | මාතලේ |
| 22 | පින්නදූව |
| 23 | පොල්ගහවෙල |
| 24 | නාරම්මල |
| 25 | මාලබේ |
| 26 | පොලොන්නරුව |
| 27 | කලවාන |
| 28 | බදුල්ල |
| 29 | මැකලම් |
| 30 | කුරුඳුවත්ත |
| 31 | කොළඹ සරසවිය |
| 32 | කැලණිය |
| 33 | කලුතර |
| 34 | නිග්‍රිස් |
| 35 | හිඟුරක්ගොඩ |
| 36 | දේවාලෙගම |
| 37 | කොටියාකුඹුර |
| 38 | අම්පාර |
| 39 | නාවලපිටිය |
| 40 | මතුගම |
| 41 | අලුත්ගම |
| 42 | මීරිගම |
| 43 | බත්තරමුල්ල |
| 44 | රත්මලාන |
| 45 | වේයන්ගොඩ |
| 46 | සෙත්සිරිපාය |
| 47 | කොටහේන |
| 48 | පැල්මඩුල්ල |
| 49 | ගනේමුල්ල |
| 50 | ගල්කිස්ස |
| 51 | හොරණ |
| 52 | හෝමාගම |
| 53 | රද්දොලුගම |
| 54 | බණ්ඩාරගම |
| 55 | මොරටුව |
| 56 | කිරිබත්ගොඩ |
| 57 | කොහුවල |
| 58 | වෙන්නප්පුව |
| 59 | බලංගොඩ |
| 60 | කටුනායක |
| 61 | කෑගල්ල |
| 62 | ආනමඩුව |
| 63 | පස්සර |
| 64 | බණ්ඩාරවෙල |
| 65 | යටියන්තොට |
| 66 | වැල්ලවාය |
| 67 | හික්කඩුව |
| 68 | මොණරාගල |
| 69 | කොටදෙණියාව |
| 70 | රක්වාන |
| 71 | මැදගම |
| 72 | කුලියාපිටිය |
| 73 | බොරලැස්ගමුව |
| 74 | සමන්තුරෙයි |
| 75 | ගම්පහ |
| 76 | අතුරුගිරිය |
| 77 | මාතර |
| 78 | රාගම |
| 79 | නිවිතිගල |
| 80 | ගම්පොල |
| 81 | හෝකන්දර |
| 82 | හැටන් |
| 83 | නින්දවූර් |
| 84 | වාද්දුව |
| 85 | බොරලන්ද |
| 86 | නොච්චියාගම |
| 87 | කිලිනොච්චිය |
| 88 | රිකිල්ලගස්කඩ |
| 89 | පුස්සැල්ලාව |
| 90 | ගම්පොල - 2 |
| 91 | තිරුක්කෝවිල් |
| 92 | තල්ගස්වල |
| 93 | කිරිදිවැල |
| 94 | පූගොඩ |
| 95 | දෙබරවැව |
| 96 | මිද්දෙණිය |
| 97 | පිළිමතලාව |
| 98 | හතරලියද්ද |
| 99 | කැකණදුර |
| 100 | මාලිගාවත්ත |
| 101 | නාවින්න |
| 102 | කලේගාන |
| 103 | මන්නාරම |
| 104 | පොළොන්නරුව - 2 |
| 105 | මත්තෙගොඩ - 2 |
| 106 | මොරටුව - 2 |
| 107 | පිටිගල |
| 108 | කොච්චිකඩේ |
| 109 | උහන |
| 110 | හබරාදූව |
| 111 | මැදිරිගිරිය |
| 112 | ලුණුගල |
| 113 | අනුරාධපුර - 2 |
| 114 | බලගොල්ල |
| 115 | තලවකැලේ |
| 116 | මල්ලවපිටිය |
| 117 | මාවරමණ්ඩිය |
| 118 | කටුනායක - 2 |
| 119 | බකමූණ |
| 120 | වරකාපොල |
| 121 | ඉබ්බාගමුව |
| 122 | කඩුවෙල |
| 123 | වැලිමඩ |
| 124 | මහරගම - 2 |
| 125 | වාරියපොල |
| 126 | මැදවච්චිය |
| 127 | නාරාහේන්පිට |
| 128 | මහනුවර |
| 129 | බම්බලපිටිය |
| 130 | හබරකඩ |
| 131 | නිට්ටඹුව |
| 132 | බැලුම්මහර |
| 133 | රාගල |
| 134 | කරාපිටිය |
| 135 | කලුවැල්ල |
| 136 | වැලිවේරිය |
| 137 | ඇත්ගාල |
| 138 | මහව |
| 139 | තලවතුගොඩ |
| 140 | කහතුඩුව |
| 141 | නුවරඑළිය |
| 142 | බඩල්කුඹුර |
| 143 | ඉමදූව |
| 144 | කොටපොල |
| 145 | පේදුරුතුඩුව |
| 146 | අඟුණුකොල පැලැස්ස |
| 147 | දෙණියාය |
| 148 | නාගොඩ |
| 149 | රත්මලාන 2 |
| 150 | මාවනැල්ල |
| 151 | වැලිකන්ද |
| 152 | සීදූව |
| 153 | පුවක්පිටිය |
| 154 | මීපේ |
| 155 | ගලගෙදර |
| 156 | සියඹලාණ්ඩුව |
| 157 | සූරියවැව |
| 158 | අලව්ව |
| 159 | මාකඳුර |
| 160 | වැලිපිල්ලෑව |
| 161 | මොරවක |
| 162 | පන්නල |
| 163 | පල්ලෙබැද්ද |
| 164 | යක්කල |
| 165 | බද්දේගම |
| 166 | තඹුත්තේගම |
| 167 | මොරොන්තුඩුව |
| 168 | තල්දූව |
| 169 | බණ්ඩාරවත්ත |
| 170 | කහවත්ත |
| 171 | ගලගෙදර - මහනුවර |
| 172 | වැල්ලවාය 2 |
| 173 | අඞ්අම්බලම |
| 174 | ගොඩකවෙල |
| 175 | මැණික්හින්න |
| 176 | නිකවැරටිය |
| 177 | හිඟුරාන |
| 178 | උඩුවන |
| 179 | පිටිපන |
| 180 | දැරණියගල |
| 181 | ගල්කිස්ස 2 |
| 182 | පානදුර |
| 183 | මහරගම |
| 184 | මහබාගේ |
| 185 | වොක්සෝල්වීදිය |
| 186 | පිළියන්දල 2 |
| 187 | පානදුර 2 |
| 188 | නෙළුව 2 |
| 189 | හක්මන |
| 190 | මත්තෙගොඩ |
| 191 | කිරිඇල්ල |
| 192 | මිරිහාන |
| 193 | පූඩලුඔය |
| 194 | පාදුක්ක |
| 195 | හංවැල්ල |
| 196 | ජාඇල |
| 197 | ගාල්ල |
| 198 | අම්බලන්ගොඩ |
| 199 | කොස්ගම |
| 200 | වලපනේ |
| 201 | කොට්ටාව |
| 202 | වව්නියාව |
| 203 | වග |
| 204 | අරලගන්විල |
| 205 | හුණුපිටිය |
| 206 | යාපනය |
| 207 | පේරාදෙණිය |
| 208 | මීගොඩ |
| 209 | කුරුණෑගල |
| 210 | ඇල්පිටිය |
| 211 | කඹුරුපිටිය |
| 212 | අහංගම |
| 213 | දික්වැල්ල |
| 214 | මන්නාරම |
| 215 | ගොඩගම |
| 216 | දෙල්කඳ |
| 217 | දිගන |
| 218 | කටුගස්තොට |
| 219 | රුවන්වැල්ල |

# Annual Report 2010



**LANKA SATHOSA LIMITED**
No. 108, 1st Floor, Negris Building,
York Street, Colombo 01.
General Phone No. : 2436301 - 2
Fax : 2437583